# උපදෙස් පත්‍රිකාව

## අ.පො.ස.(උ.පෙළ) හැදෑරීමට ජනාධිපති අරමුදල මගින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවීම.

**සුදුසුකම්**

1. අයදුම්කරු 2021 (2022) වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයට පළමුවරට පෙනී සිට 2024 වර්ෂයේදි අ.පො.ස.(උ.පෙළ) හැදෑරීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ලැබ සිටිය යුතුය.

2. රජයේ පාසලක හෝ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසලක හෝ ඉගෙනුම ලබන ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක විය යුතුය.

3. අයදුම්කරුවන්ගේ පවුලේ මාසික ආදායම රු75,000/- නොඉක්මවිය යුතුය.

**අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම**

- අයදුම්පත්‍රයේ අංක 01 සිට 06 දක්වා අයදුම්කරු විසින් සම්පූර්ණ කලයුතුය.
- අදාල ප්‍රශ්න සඳහා ලකුණු ලබා දීමද අයදුම්කරු විසින්ම සිදු කල යුතු අතර අදාල ප්‍රතිඵල සත්‍ය බවට විදුහල්පති විසින් සහතික කල යුතුය.
- පවුලේ ආදායම් තත්වය පිළිබඳව තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ සහතිකයද , ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයද සමඟින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ඔබ අ.පො.ස. (සා/පෙළ) හදාරන ලද පාසලේ විදුහල්පති වෙත පමණක් භාර දිය යුතුය.

**ලකුණු ලබා දීමේ ක්‍රමවේදය**

| | |
|---|---|
| 01.01. පවුලේ වයස 21ට අඩු දරුවන් සංඛ්‍යාව දෙදෙනෙකු හෝ ඊට වැඩිනම් | - ලකුණු 04 |
| 01.02. දෙමව්පියන් දෙදෙනාම අහිමි වීම | - ලකුණු 06 |
| 01.03. දෙමව්පියන්ගෙන් එක් අයෙක් අහිමිවීම | - ලකුණු 03 |
| 01.04. දෙමව්පියන් නොමැති භාරකරුවෙකු ලඟ සිටිනම් | - ලකුණු 02 |
| 01.05. ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවයකදී | - ලකුණු 10 |

(අර්ධ දුබලතාවයක් නම් ලකුණු 05 ක් පමණක් ලබා දෙන්න)

(උපරිම ලකුණු 25)

**සැ.යු. :-** දරුවන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන්ය. ශාරීරික දුබලතාවයන් පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කළයුතුයි.

- අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රථිපල

02.01 අ.පො.ස (සා.පෙළ) විභාගයේ අනිවාර්ය විෂයන් සඳහා

| | | | |
|---|---|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා | (A) | - | ලකුණු 08 |
| අධි සම්මාන සාමාර්ථයක් සඳහා | (B) | - | ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා | (C) | - | ලකුණු 04 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | (S) | - | ලකුණු 02 |

අධ්‍යා./ලේ. ගේ 2006/09 හා 2006.03.07 දිනැති චක්‍රලේඛයේ සඳහන් වන සමත් වූ කාණ්ඩ විෂයයන් සඳහා එක් විෂයයකට ලකුණු 01 බැගින් විෂයයන් 02 ක උපරිමයකට යටත්ව ලකුණු දෙකක් ලබාදිය යුතුය.

(උපරිම ලකුණු 50)

- 3. ක්‍රීඩා
  වොලිබෝල් / දැල්පන්දු / පාපන්දු / පැසිපන්දු / ක්‍රිකට් / එල්ලේ / බැඩ්මින්ටන් / කබඩි / රගර්/ හොකී / මලල ක්‍රීඩා / චෙස් / කැරම් / ටෙනිස් / පිහිනුම් / ජිම්නාස්ටික් / කරාටේ / මේස පන්දු

| | ජාතික මට්ටම | පළාත් මට්ටම | කලාප මට්ටම |
|---|---|---|---|
| ක්‍රීඩා ඉසව්වලදී පළමුවන ස්ථානය | 09 | 07 | 05 |
| ක්‍රීඩා ඉසව්වලදී දෙවන ස්ථානය | 08 | 05 | 04 |
| ක්‍රීඩා ඉසව්වලදී තුන්වන ස්ථානය | 06 | 03 | 02 |
| නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

- **4. සෞන්දර්ය හෝ විෂය සමගාමී ක්‍රියාකාරකම්**

අ. ශිෂ්‍යභට
බාලදක්ෂ / බාලදක්ෂිකා
ප්‍රථමාධාර/පරිසර නියමු/වෙනත්

ආ. ජාතික භාෂා හා සාහිත්‍ය තරඟ
විවාද/කථික/නිවේදන/දැනුම මිනුම
චිත්‍ර/නැටුම්/වාදනය/ගායනය/වේදිකා නාට්‍ය
විෂය ප්‍රවීනතා ජයග්‍රහණ

| | පළාත් <u>මට්ටම</u> | කලාප <u>මට්ටම</u> | ජාතික <u>මට්ටම</u> |
|---|---|---|---|
| පළමුවන ස්ථානය | 09 | 07 | 05 |
| දෙවන ස්ථානය | 08 | 05 | 04 |
| තුන්වන ස්ථානය | 06 | 03 | 02 |
| නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

- **<u>5. ශිෂ්‍ය නායකත්වය</u>**

| | |
|---|---|
| පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක | 05 |
| පාසල් උප ප්‍රධාන ශිෂ්‍ය නායක | 04 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ) | 03 |
| ශ්‍රේණි නායක | 02 |
| පන්ති නායක | 01 |

(උපරිම ලකුණු 05 කි)

සැ.යු. :-

- **ඉහත 03 සහ 04 හිදි, ඔබ එකම විෂය සමගාමී කටයුත්තක් සඳහා ජාතික,පළාත් හා කලාප යන මට්ටම් සියල්ලටම ලකුණු ලබා නොදිය යුතුය. ලකුණු දීමේදී සැලකිල්ලට ගතයුත්තේ ඉහළම මට්ටම් පමණි.**

- **ඉහත 05 හිදි ලකුණු දීමේදී සැලකිල්ලට ගතයුත්තේ ඉහළම මට්ටම් පමණි.**